# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 13,905 — 1964 ජනවාරි 7 වැනි අඟහරුවාද — 1964.1.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**සී. 383 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

### 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

මිල (ආහාර) පාලක තැන්පත් පින්නදූවගේ ආතර් සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල (ආහාර) පාලක වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1963.12.5 වෙනි දින අංක 13,845 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1963 දෙසැම්බර් 4 වෙනි දින අංක සී 382 දරණ ආහාර මිල නියෝගය මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය මෙරටට ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිල මේ දැන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි, 3 වෙනි සහ 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයිඅන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිල ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා. " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, උපලේඛනයේ 2 වෙනි, 3 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1964 ජනවාරි 7 වෙනි දින පස්වරු 12.30 ට කොළඹදී අත්සන් කරන ලදී.

පී. ඒ. සිල්වා,
මිළ (ආහාර) පාලක.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>මෙරටට ගෙන්වන්නකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. |
|---|---|---|---|
| ඇනු (රතුළූනු සහ වික්බෙලපූර් හැර වෙනත් සියළුම) ... | 26 50 ... | 27 30 ... | 0 32 |
| සුදුරු ... ... ... | 117 0 ... | 119 0 ... | 1 21 |
| කොත්තමල්ලි ... ... ... | 45 60 ... | 47 0 ... | 0 48 |
| සියළි නොකළ උළුඳු ... ... ... | 45 0 ... | 46 35 ... | 0 52 |
| මුංඇට ... ... ... | 42 40 ... | 43 0 ... | 0 44 |
| තෝර පරිප්පු ... ... ... | 48 75 ... | 50 0 ... | 0 51 |
| කඩල පරිප්පු ... ... ... | 33 0 ... | 34 0 ... | 0 35 |
| වික්පිස් ... ... ... | 37 50 ... | 40 0 ... | 0 41 |
| සුදුළූනු (බොම්බේ) ... ... ... | 44 0 ... | 46 0 ... | 0 47 |
| සියඹලා ... ... ... | 39 0 ... | 42 0 ... | 0 49 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

2. මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

1–362

---

1964 අංක ජී 1 දරණ ආහාර මිළ නියෝගය

එළු මස්

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

ගාළු පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ ආහාර පාලක තැන්පත් පියසේන මුනිදස ගමලත් සෙනෙවිරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වැනි වගන්තියෙන් මාහට පැවරී තිබෙන බලතල අනුව—

(1) අංක 12,983 සහ 1962 මාර්තු මස 12 වැනි දින ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක ජී. 4 සහ 1962 මාර්තු 5 වැනි දින දරණ ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යා කොට ඇති උපලේඛනයේ 2 සහ 3 වැනි තීරයන්හි සඳහන් මිළ, එළු මස් රාත්තලක වැඩිම මිළ වශයෙන් නියම කරමි. එකී තීරයේ මුදුනේ සඳහන් වර්ග වලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස්, එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශය තුළ එකී මිලට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) "එළුමස්" යනුවෙන් හැඟවෙන්නේ බැටළුවෙකුගේ හෝ එළුවකුගේ මාංශයයි. බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ සිරුර සාමාන්‍යයෙන් මස් මඩුවේදී පිළියෙල කිරීමේදී එනම්, බොකු, බඩවැල්, හිස, කුර සහ වෙනත් සියළු විධියේ සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන දෑය මීට ඇතුළත් නොවේ.

(4) කටු සහිත එළුමස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට විසිපහකට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කර ඇති සෑම ප්‍රදේශයකම කිසියම් තැනක වාහනයක හෝ යාත්‍රාවක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ, උපලේඛනයෙහි සඳහන් වර්ග වලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් ඇති සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළු මස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ, වාහනයේ හෝ යාත්‍රාවේ පැහැදිලිව පෙණෙන ලෙස තැබිය යුතුයි.

(6) ඉවත් කරනු ලබන දෑය සමග එළුමස් එකම ගනුදෙනුවකදී විකුණනු ලබන විට එළුමස් ඉවත් කරනු ලබන දෑයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(7) සෑම වෙළෙන්දෙකුම එළුමස් විකුණන කල්හි, එළුමස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලාගැනීමට හැකි වන සේ බර කිරන තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(8) මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් විකුණන සෑම වෙළෙන්දෙකුම, එළුමස් ලබාගන්නෙකු ඉල්ලා සිටිය විට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ එළුමස් ප්‍රමාණය, බර,

(ඇ) විකුණූ එළුමස්වල විස්තරය; සහ

(ඈ) විකුණූ මස් ප්‍රමාණයට ගෙවූ මුදල ද සඳහන් විය යුතුයි.

(9) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළම කිසිවකු උපලේඛනයේ සඳහන් දෑය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කවලම්කොට නොවිකිණිය යුතුයි.

(10) උපලේඛනයේ සඳහන් දෑය විකුණන කල්හි, එකී දෑය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය එම උපලේඛනයේ 2 සහ 3 වැනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(11) මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් හැඟවෙන්නේ ඇවැර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද නියම කරමි.

1964 ජනවාරි මස 1 වැනි දින, පෙ.ව. 9 ට ගාල්ලේ දී අත්සන් තබන ලදී.

පී. එම්. ජී. සෙනෙවිරත්න,
ගාළු පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ ආහාර පාලක.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>එළුමස් කටු රහිත රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>එළු මස් කටු සහිත රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| ගාළු පාලන දිස්ත්‍රික්කය ... | 2 50 ... | 2 10 |

සැලකිය යුතුයි.—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතා වැඩි මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැක.

1—302

# ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

## ශ්‍රී ලංකා මහ බැංකුව

**1963 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය**

(මුදල් නීති පනතේ 34 වැනි (පරිච්ඡේදය 422) වගන්තියට අනුව)

**වගකීම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම** | | |
| ප්‍රාග්ධනය ... ... | 1,50,00,000 00 | |
| අතිරික්තය ... ... | 4,00,00,000 00 | |
| | | 5,50,00,000 00 |
| **වගකීම්** | | |
| සංසරණයෙහි පවත්නා නෝට්ටු | 85,88.34,762 00 | |
| සංසරණයෙහි පවත්නා කාසි ... | 4,20,45,168 00 | |
| | | 90,08,79,930 00 |
| **තැන්පතු** | | |
| රජය ... ... | 10.10.355 00 | |
| රාජ්‍ය නියෝජ්‍යත්ව හා සංස්ථා ... | 35.41,972 00 | |
| වෙළෙඳ බැංකු ... | 10,85,44,819 00 | |
| ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ... | 20,90,02,384 00 | |
| අනෙකුත් ... ... | 34,87,932 00 | |
| | | 32,55,87,462 00 |
| **අනෙකුත් වගකීම් හා ගිණුම්** ... ... | | 12,69,70,633 00 |
| | | 140,84,38,025 00 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| **ජාත්‍යන්තර සංචිතය** | | |
| පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් (භාණ්ඩාගාර බිල් පත් ඇතුළුව) ... ... | 4,81,73,212 00 | |
| විදේශීය රාජ්‍ය ණය පත් ... | 6,59,98,624 00 | |
| | | 11,41,71,836 00 |
| **දේශීය වත්කම්** | | |
| **ණය සහ අත්තිකාරම්—** | | |
| *රජයට ... ... | 20.31,94 042 00 | |
| අනෙකුත් අයට ... | 3,79,50,000 00 | |
| රජයේ සහ රජය සහතික කළ ණය පත් ... | 102,48,92,973 00 | |
| | | 126.60.37.015 00 |
| **අනෙකුත් වත්කම් හා ගිණුම්** ... ... | | 2,82,29,174 00 |
| | | 140.84.38.025 00 |

*1961 අංක 7 දරණ ජාත්‍යන්තර සංවර්ධන සංගම් ගිවිසුම් පනතේ සහ සංශෝධිත බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පනතේ (පරිච්ඡේදය 424) නියමයන් ප්‍රකාර ජා. මූ. ම., ජා. ප්‍ර. ස. බැ. හා ජා. ස. ස. ට ලංකාවේ දායක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රු. 3,96,94,042ක විශේෂ ණය ද ඇතුළත් වෙයි.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන,
අධිපති.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී.

ඉහත සඳහන් ශේෂ පත්‍රය මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදී. මහ බැංකුවේ පොත් හා වාර්තා සහ මා වෙත සපයා ඇති තොරතුරු හා විස්තර අනුව, 1963 දෙසැම්බර් මස 31 වැනි දිනට බැංකුවේ කටයුතු පිළිබඳ පැවැති තත්ත්වය සාධාරණව හා සත්‍යව පිළිබිඹු වන පරිදි, ශේෂ පත්‍රය නිසි ලෙස සකස් කොට ඇති බව මගේ අදහස වෙයි.

1964 ජනවාරි මස 7 වැනි දින,
කොළඹ දී ය.

බී. එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
වැඩ බලන ඔඩිටර් ජනරාල්.

1–301

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි